ප්‍රසම්පාදන දැන්වීමයි

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

එන් - 46

කොන්ත්‍රාත් අංකය - DGP/OS/01/Bar Soap/2024-II

බාර් සබන් මිලදී ගැනීම

කොළඹ 08, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, අංක 118 පිහිටි රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තු සේවකයින් සඳහා බාර් සබන් මිල දී ගැනීමට, අවශ්‍යතා සපුරාලන පිළිගත් සැපයුම්කරුවන්ගෙන් පමණක් මාස 05ක කාලයකට ජාතික තරගකාරී ලංසු කැඳවීම යටතේ ලංසු කැඳවනු ලැබේ.

1. ලංසු ලේඛන ලබාගැනීම සඳහා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ රජයේ මුද්‍රණාලයාධිපති නමින් ලිඛිත ඉල්ලීමක් කළ යුතුය. එකී ඉල්ලීමෙන් පසු ආපසු නොගෙවනු ලබන **රු.2000.00 ක** මුදලක් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ සරප් වෙත ගෙවා ලබා ගන්නාවූ රිසිට්පත ඉදිරිපත් කිරීමෙන් පසු **2024.04.24** දින සිට **2024.05.14** දින දක්වා සතියේ වැඩ කරන දිනයන්හි පෙ.ව. 9.00 සිට ප.ව.3.00 දක්වා පහත ලිපිනයේ පිහිටි රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ වෙනත් සැපයීම් අංශයෙන් ලංසු ලියවිලි ලබාගත හැකි අතර, මෙම ලංසු ලියවිලි ගාස්තු ගෙවීමකින් තොරව පරීක්ෂා කර බැලිය හැකිය.
2. ලංසුකරු ස්වකීය ලංසුව සමඟ, ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වාණිජ බැංකුවකින්, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, **"රජයේ මුද්‍රණාලයාධිපති"** නමින්, රු. 40,000.00 ක ලංසු ඇපකරයක්/ බැංකු ඇපකරයක් හෝ එකී වටිනාකම, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ගිණුම් අංශයේ සරප් කවුන්ටරය වෙත ගෙවීම් කර ලබාගත් රිසිට්පත ඉදිරිපත් කළ යුතු වේ.
3. නිසි පරිදි සම්පූර්ණ කරන ලද ලංසු ලියවිලි ඇතුළත් අයදුම්පත්, කවරයක බහා, **2024.05.15 දින ප.ව. 02.00 ට** පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ දෙපාර්තමේන්තුවේ වෙනත් සැපයීම් අංශයේ තබා ඇති ප්‍රසම්පාදන පෙට්ටියට බහාලීම හෝ කළ යුතුය. ඔබගේ ලංසු ඉදිරිපත් කරන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ බාර් සබන් මිලදී ගැනීම"** සඳහා ලංසු 2024 යනුවෙන් සඳහන් කළ යුතු ය. **2024.05.15 දින ප.ව. 02.00 ට** ලංසු භාර ගැනීම අවසන් වන අතර, ඒ විගසම ලංසු විවෘත කරනු ලැබේ. මෙම අවස්ථාව සඳහා ඔබට හෝ ඔබේ නියෝජිතයෙකුට සහභාගී විය හැක.
3. වැඩි විස්තර, සතියේ වැඩ කරන දිනයන්හි **පෙ.ව. 8.30 සිට ප.ව. 3.30** දක්වා පහත ලිපිනය සඳහන් කාර්යාලයේ වෙනත් සැපයීම් අංශයෙන් ලබාගත හැක.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08
2024.04.24

දුරකථන : 0112673311 /ෆැක්ස් :011 2698653
වෙබ් අඩවිය : www.documents.gov.lk
විද්‍යුත් තැපෑල : othersupplydgp@gmail.com